වයඹ රහ අබිසෙස්

වයඹ පළාත් රාජ්‍ය නාට්‍යය තරඟාවලිය - ව්‍යවස්ථාව 2026

වයඹ පළාතේ සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින්, එහි සාධනීය තත්ත්වයන් රැකගනිමින් හා පෝෂණය කරමින් යහපත් වර්යාවන් සහිත උසස් රසඥතාවයකින් හෙබි මානව දයාවෙන් පෝෂිත සංස්කෘතික පුරවැසියන් බිහි කිරීමෙහිලා පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයට විශාල වගකීමක් පැවරී ඇත.

එවැනි පුරවැසියන් බිහි කිරීමට පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේපළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන විවිධ වැඩසටහන් අතර වයඹ පළාත් රාජ්‍ය නාට්‍ය උළෙලට සුවිශේෂී ස්ථානයක් හිමිවේ.

නාට්‍ය උළෙල පැවැත්වීමේ අරමුණු

1. වයඹ පළාතේ නාට්‍ය හා රංග කලා ක්ෂේත්‍රයේ සහජ දක්ෂතා සහිත නිර්මාණකරුවන් හඳුනා ගැනීම.
2. ප්‍රශස්ත නාට්‍ය නිර්මාණ බිහිකිරීම උදෙසා එම නිර්මාණකරුවන්ගේ කුසලතා ඔප් නංවා ගැනීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. වයඹ පළාතෙන් බිහිවෙන නාට්‍ය ශිල්පීන් හා ඔවුන්ගේ නිර්මාණ ධෛර්යවත් කිරීම හා ගෞරවනීය ඇගයීමට පාත්‍ර කිරීම.
4. ඇගයීමට හා ගෞරවාදරයට පාත්‍ර කරනු ලැබූ නිර්මාණකරුවන්ගේ තොරතුරු ලේඛනගත කිරීම හා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.
5. නාට්‍ය කලාව සම්බන්ධව උසස් රසවින්දන ශක්තියක් සහිත ප්‍රේක්ෂක පිරිසක් බිහිකර ගැනීමට විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීම.
6. උක්ත ක්‍රියාවලිය මගින් ලාංකීය නාට්‍ය සංස්කෘතිය පෝෂණය කිරීමට දායකත්වය දැක්වීම.
7. අන්තර් පළාත් සංස්කෘතික භූවමාරු වැඩසටහන් මඟින් වයඹ පළාත් නාට්‍ය නිර්මාණ කරුවන්ගේ නාට්‍ය නිර්මාණ ප්‍රේක්ෂක අවධානයට ලක් කිරීම.
8. දේශීය / විශ්ව විද්‍යාල හා විදේශ නාට්‍ය උළෙලවල් සඳහා වයඹ කාලකරු නාට්‍ය නිර්මාණ ඉදිරිපත් කිරීම හා ඒ තුළින් නිර්මාණ ඇගයීමට ලක් වීමට අවකාශ සලසා දීම

පොදු කොන්දේසි

1. වයඹ පළාත් රාජ්‍ය නාට්‍ය තරඟාවලිය පැවැත්වීම සම්බන්ධව පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ විසින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් හෝ වයඹ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන වෙබ් අඩවියක් මගින් හා පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව රාජකාරි කරනු ලබන පළාත් සංස්කෘතික නිළධාරීන් මගින් දැනුවත් කර අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත කැඳවූ දිනයේ සිට මාසයක් ඉකුත් වීමට පෙර අයදුම්පත්‍රය යොමු කළ යුතුය.

3. තරඟ සඳහා අයදුම් කළ හැක්කේ හා නිර්මාණ දායකත්වය ලබාදිය හැක්කේ පහත සඳහන් අයවලුන්ට පමණි.

    I. වයඹ පළාතේ ස්ථීර පදිංචියක් සහිත පුරවැසියන්.
    II. වයඹ පළාතේ පිහිටි රජය පිළිගත් විධිමත් අධ්‍යාපන ආයතනයක ඉගෙනුම් ලබන සිසුන්. (විශ්වවිද්‍යාල, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, කාර්මික හෝ තාක්ෂණික විද්‍යාල)

4. වයඹ පළාත් රාජ්‍ය නාට්‍ය තරඟාවලිය සඳහා නාට්‍ය පිටපතක් ඉදිරිපත් කළ පසු, එම පිටපත ඉදිරි වට සඳහා නිර්දේශ කරනු ලැබුවහොත්, නාට්‍යය නිෂ්පාදනය කර වේදිකාගත කිරීම සඳහා ඔබ බැඳී සිටිය යුතුය. සාධාරණ හේතු දැක්වීමකින් තොරව එය ඉටු කිරීමට අපොහොසත් වන්නේ නම්, එළඹෙන වසරේ නාට්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමට ඔබට අවස්ථාව නොලැබේ.

5. නාට්‍ය පිටපත A4 කඩදාසිවල (තනි පැත්තේ) සම්මත නාට්‍ය පිටපත් ආකෘතියට අනුව සකස්කර පිටුවේ අවකාශය නිසි පරිදි බෙදා ගනිමින් Font size – 12 වන පරිදි පරිගණක මගින් සකසා හෝ යතුරු ලියනය කර තිබිය යුතුය.

6. නාට්‍ය නිෂ්පාදනය සම්මත පින්තූර රාමු වේදිකාවෙන් බැහැරව විකල්ප රංග භූමියක රඟ දැක්වීමට අපේක්ෂා කරන්නේ නම්, ඒ පිළිබඳව තොරතුරු අයදුම් පත්‍රයේ සඳහන්කර තිබිය යුතුය.

7. මීට පෙර වයඹ රාජ්‍ය නාට්‍ය උළෙලට හෝ වෙනත් නාට්‍ය උළෙලකට හෝ ඉදිරිපත් වී ඇගයීමට ලක් වූ හෝ ලක් නොවූ නාට්‍යයක් මෙම නාට්‍ය උළෙලට නව නිෂ්පාදනයක් ලෙස ඉදිරිපත් කරන්නේ නම්, එම නාට්‍යයේ මූල් නිෂ්පාදනය සිදුකර වසර 10කට වැඩි කාලයක් ගතවී තිබිය යුතුය. මෙහිදී අධ්‍යක්ෂකවරයා විසින් එහි නවාංග කවරේ ද, යන්න පිළිබඳව විස්තරයක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

8. අවසන් වටයට තෝරාගෙන තිබෙන නාට්‍යයක් එම වටය සඳහා තරඟ නොවදින්නේ නම්, එම නාට්‍ය රංගගත කිරීමට නියමවී තිබෙන දිනයට දින 07 ට පෙර ඒ සම්බන්ධයෙන් අයදුම්කරු විසින් පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂකට ලිඛිතව දැන්විය යුතුය.

9. නාට්‍යවල තේමා / කථා වස්තූන් / ගී පද මාලා / දෙබස් ආදිය ජාති, ආගම්, සංස්කෘතික හෝ දේශපාලනික මතිමතාන්තර ආදිය හේතු කොටගෙන කිසියම් පුරවැසියෙක් හෝ සමාජ කොට්ඨාසයකගේ ගෞරවය, අයිතිවාසිකම් උල්ලංඝනය වෙන ආකාරයේ හෝ සමාජ විරෝධී අරමුණුවලට හේතුවන්නාවූ ආකාරයේ ඒවා නොවිය යුතුය. එසේ පවතින බව තහවුරු වුවහොත් එම පිටපත් වයඹ පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත ප්‍රතික්ෂේප කිරීමේ බලය පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂක වෙත පවරා ඇත.

10. අයදුම්පත්‍රය යොමු කිරීමේදී සත්‍ය හා නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොවන බව තහවුරු වුවහොත් අයදුම්කරුව තරගයෙන් ඉවත් කිරීමට හෝ නාට්‍ය උළෙලින් පසුව වුවද, ප්‍රදානය කරන ලද මුදල් ත්‍යාග, සම්මාන හෝ සහතික පත්‍ර අවලංගු කිරීමේ බලය වයඹ පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂක වෙත පවරා ඇත.

11. මූලික වටයට ඉදිරිපත්ව අවසන් වටයට තේරීපත් වන නාට්‍ය සඳහා පමණක් දිරිගැන්වීමක් වශයෙන් නාට්‍ය පිටපත සඳහා වේදිකා පසුතල ප්‍රවාහනය වෙනුවෙන් යම් මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට සංස්කෘතික දෙපාර්තමේන්තුව සලකා බලනු ලැබේ.

12. මූලික වටයේදී තෝරා ගෙන තිබෙන නාට්‍ය පිටපත් ප්‍රමාණය සුලු ප්‍රමාණයක් වන අවස්ථාවකදී අවසාන වටය පමණක් පැවැත්වීමට හෝ එවැනි තත්ත්වයක් තුළ නාට්‍ය පවත්වන ස්ථානය තීරණය කිරීමට හෝ රටේ උද්ගතවන යම් සුවිශේෂී තත්ත්වයන් මත නාට්‍ය තරග හා නාට්‍ය උළෙල පැවැත්වීම සම්බන්ධයෙන් තිරණ ගැනීමට පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂක බලය පවරා ඇත.

13. නාට්‍යය තරගයට අදාල පොදු කොන්දේසිවලට හා ඒ ඒ නාට්‍යය අංශය සඳහා අදාළ කොන්දේසිවලට අනුව කටයුතු කිරීමට තරගකරුවන් එකඟ විය යුතුය.

14. මෙම නාට්‍ය උළෙල සඳහා ඉදිරිපත්කර ඇති නාට්‍ය පිටපතක් හෝ නාට්‍ය නිෂ්පාදනයක් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් අයිතිවාසිකම් පෑමක් හෝ විරෝධය පෑමක් සිදුකරන්නේ නම්, එය දිවුරුම් ප්‍රකාශයක් මගින් පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ විසින් පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

15. අවසාන වටයේ ප්‍රතිඵල ලබා දීමෙන් අනතුරුව නාට්‍ය උළෙලේ සම්මාන ප්‍රදානෝත්සවය පිළිබඳව පළාත් සංස්කෘතික අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් වලට අනුව පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

16. ශ්‍රී ලාංකේය ස්වීය නාට්‍ය කලාව දියුණු කිරීම හා එම නාට්‍ය ක්ෂේත්‍රය කෙරෙහි නාට්‍යකරුවන්ව පෙළඹවීම මෙම නාට්‍ය උළෙල පැවැත්වීමෙන් විශේෂයෙන් බලාපොරොත්තුවෙන බැවින් තරගයට ඉදිරිපත්ව ඇති එම නාට්‍ය කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව සළකා බලනු ලැබේ.

17. නාට්‍ය තරගයේ එක් තරඟ ශීර්ෂයක් සඳහා ශිල්පින් එක් අයෙකුට වඩා නම් කළ හැක්කේ නාට්‍යයේ අනුශාංගික අංග අතරින් අත්‍යාවශ්‍ය තරග ශීර්ෂයක් සඳහා පමණක් වන අතර එය උපරිම දෙදෙනෙකුට සීමා විය යුතුය. (උදා:- වේදිකා පරිපාලනය) නාට්‍ය උළෙල අවස්ථාවේදී ජයග්‍රාහී මුදල් ත්‍යාග පිරිනමන්නේ එම ශීර්ෂය සඳහා වෙන් කළ මුදල පමණි.

<u>අයදුම්පත් යොමු කිරීමේදී,</u>

I. වයඹ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අයදුම් පත්‍රයක් මගින් අයදුම් කළ යුතුය.

II. අධ්‍යාපන ආයතන නියෝජනය කරමින් ඉදිරිපත් වන අයදුම්කරුවන් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා මගින්ද, සෙසු අයදුම්කරුවන් තමා පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මගින් පදිංචිය සනාථ කර තම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළාත් සංස්කෘතික නිලධාරී නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව අයදුම්පත්‍රය යොමු කළ යුතුය.

III. නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා / නිෂ්පාදකයා විසින් අයදුම්පත්‍රය යොමු කළ යුතුය.

IV. නාට්‍යයේ අත් පිටපත් රචකයා එම නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා / නිෂ්පාදකවරයා නොවන අවස්ථාවක එහි පිටපත් රචකයා විසින් නාට්‍යය අධ්‍යක්ෂණය කිරීමට අනුමැතිය ලබා දුන් ලිපිය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

V. අයදුම්පත්‍රය සමග නාට්‍ය පිටපත් 03 ක් එහි කථා සාරාංශය හා චරිත පිළිබඳ විස්තර සහිතව පහත සඳහන් ලේඛන සහිතව ඉදිරිපත් කළ යුතුය.

A. නාට්‍ය පිටපත ස්වතන්ත්‍ර පිටපතක් නම් පිටපත් රචකයා විසින් ඒ බව සහතික කළ ලේඛනය.

B. අනුවර්තන හෝ පරිවර්ත පිටපතක් නම් එම පිටපතේ මුල් කෘතිවල තොරතුරු සංක්ෂිප්තව සඳහන් ලේඛනය.

C. කලින් ඇගයුමට ලක්ව නැවත ඉදිරිපත් කරනු ලබන නාට්‍යයක් නම්, මුල් නිෂ්පාදනය සිදුකර වසර 10ක් ඉකුත්ව ඇති බව සනාථ කිරීමේ ලේඛන හා එහි නවාංග කවරේද, යන්න පිළිබඳ සඳහන් ලිපියක් අධ්‍යක්ෂවරයා විසින් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

D. නාට්‍ය පිටපත ඉදිරිපත් කිරීමේදී එහි කිසිදු තැනක නාට්‍යයේ රචකයාගේ නම හෝ අනන්‍යතාව සඳහන් සටහනක් නොකළ යුතුය.

E. කෘතිම බුද්ධිය (AI තාක්ෂණය) භාවිතා කර නාට්‍ය පිටපත් රචනා කර හෝ එසේ උත්සහ කර ඇත බව, පරීක්ෂාවකදී තහවුරු වුවහෝත් එකී පිටපත් නාට්‍ය තරඟාවලියෙන් ඉවත් කරනු ලැබේ.

F. දේශීය හෝ විදේශීය සිනමා පටයක් / නව කතාවක් / කෙටි කතාවක් ඇසුරු කර නාට්‍ය පිටපත් රචනා කර ඇත්තේ නම් එම නිර්මාණ ස්වතන්ත්‍ර නිර්මාණ ලෙස සලකනු නොලැබේ. එසේ සකස් කර ඇත්තේ නම් එහි මූල් කෘතිය පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය. මූලික වටයේ පිටපත් ඇගයීමේදී මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනු ඇත.

VI. නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026 මැයි මස 15** වන දින හෝ ඊට පෙර පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ තම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළාත් සංස්කෘතික නිලධාරි මගින් යොමු කළ යුතුය.

VII. ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත්‍ර යොමු කිරීමේදී ලියුම් කවරයේ වම් පස ඉහල "වයඹ රාජ්‍ය නාට්‍ය උළෙල" ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කළ යුතුය.

නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ,
පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව,
ලංකා බැංකු උඩු මහල,
වයඹ පළාත් සභා සංකීර්ණය,
කුරුණෑගල.

දූරකථන අංකය - 037-2234566
වෙබ් ලිපිනය - www.moe.gov.lk
face book - ministry of cooperative nwp

තරග විනිශ්චය කිරීම

I. නාට්‍ය තරඟාවලියේ සියලු තරග විනිශ්චය කරනු ලබන්නේ නාට්‍ය කලාව හා එහි අනුශාංගික අංග පිළිබඳව ප්‍රාමාණික දැනුමක් සහිත ජාතික මට්ටමේ පලපුරුද්දක් ඇති ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් විසිනි. විනිශ්චය කටයුතු සුදුසු නිර්ණායක මත සිදුකරනු ලැබේ.

II. එම විනිශ්චය මණ්ඩලය පත්කරනු ලබන්නේ හා යම් සුවිශේෂ කරුණක් මත ඉවත් කරනු ලැබීමේ බලය වයඹ පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ සතු වේ.

III. තරඟකරුවන් විසින් තරග විනිශ්චය පිළිබඳව විනිශ්චය මණ්ඩලයට හෝ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට බලපෑම් කිරීම හෝ බලපෑම් කිරීමට උත්සාහ කිරීම හෝ නොකළ යුතු අතර එසේ සිදුවන බව තහවුරු වුවහොත් එම නිර්මාණකරුවා තරඟයෙන් ඉවත් කිරීමට හෝ ඉදිරි තරඟවලට සහභාගි වීම වර්ෂයක් හෝ වර්ෂ කිහිපයක් අත්හිටුවීමේ බලය පළාත් සංස්කෘතික අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂකට ඇත.

IV. මෙම නාට්‍ය තරඟයේ සියලු වටයන් සුදුසු විනිශ්චයකරුවන් මඟින් විදිමත් විනිශ්චයකට ලක්කරනු ලබන අතර අවසාන වටය විනිශ්චයට විනිශ්චයකරුවන් 05 දෙනෙක් පත් කරනු ලැබේ.

V. දෙවන වටයට හා අවසාන වටයට ඉදිරිපත්වන නාට්‍යයක් වෙන්කර දී ඇති දිනයේදී හා වේලාවේදි රංගගත කිරීමට අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කළ යුතු අතර, එසේ නොවන අවස්ථාවලදී, එම නාට්‍යය තරඟයෙන් ඉවත් කිරීමට විනිශ්චය මණ්ඩලය කටයුතු කළ යුතුය.

VI. මූලික වටයේ හා දෙවන වටයේ විනිශ්චය මණ්ඩල ප්‍රතිඵල හා එම ප්‍රතිඵල සඳහා විනිශ්චය මණ්ඩලය පදනම් කර ගනු ලැබූ නිර්ණායක පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ භාරයේ තබා ගනිමින් අවසන් වටයේ කටයුතු සංවිධානය කරනු ලැබේ.

VII. මෙම චක්‍රලේඛනයේ සඳහන් නාට්‍ය ක්ෂේත්‍ර වෙනුවෙන් අවසාන වටයේදී සම්මාන, සහතික ලබාදීමට සුදුස්සන් නිර්දේශ කිරීම විනිශ්චය මණ්ඩලය විසින් සිදුකළ යුතුය. කිසියම් සම්මානයක් ලබාදීමට සුදුස්සන් නොමැතිනම් ඒ පිළිබඳ හේතු ලිඛිතව නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය. විශේෂ සම්මානයක් හෝ කුසලතා සම්මානයක් දීමට සුදුස්සන් සිටීනම්, නිර්දේශ කිරීමට විනිශ්චය මණ්ඩලයට හැකියාව ඇත.

VIII. අවසාන වටයේ ප්‍රතිඵල,ඊට අදාළ හේතු පාඨ හා විනිශ්චයන්ට පදනම් කර ගනු ලැබූ නිර්ණායකයන් සහිත තොරතුරු කවරයක බහා ආරක්ෂිතව විනිශ්චය මණ්ඩලය විසින් පළාත් සංස්කෘතික ලේකම්ට බාර දිය යුතුය.

IX. සම්මාන ප්‍රදානෝත්සවයේදී ප්‍රකාශයට පත්කරනතෙක් එම ප්‍රතිඵල පළාත් සංස්කෘතික අමාත්‍යාංශ ලේකම් භාරයේ පවතී.

X. තරග විනිශ්චයන් පිළිබඳව සම්පූර්ණ බලය හා වගකීම විනිශ්චය මණ්ඩලය සතුවන අතර, සියලු විනිශ්චයන් සම්බන්ධයෙන් එම විනිශ්චයකරුවන් සාමූහික වගකීමකට යටත්වනු ලැබේ. එසේම විනිශ්චයන් සම්බන්ධ රහස්‍යබාවය රැකීමද, විනිශ්චයකරුවන්ගේ වගකීමකි.

XI. තරගයට ඉදිරිපත් වූ තරගකරුවන්ට තරග විනිශ්චයන් පිළිබඳව වැඩියමක් තොරතුරු දැනගැනීමට අවශ්‍යනම්, තරග ප්‍රතිඵල නිකුත් කර දින 30 ඉකුත් වීමට පෙර පළාත් සංස්කෘතික නියෝජ්‍ය අධ්‍යක්ෂකගෙන් ඒ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමකින් විමසිය යුතුය.

තරගාවලිය පැවැත්වෙන ක්‍රමවේදය

මූලික වටය

I. තරගයට අයදුම් කර ඇති නාට්‍ය පිටපත් වක්‍රලේඛනයට අනුකූලව ඉදිරිපත්කර ඇත්දැයි පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාකර නිවැරදි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්‍ර තෝරාගෙන එම පිටපත් දින 14 ක් ඇතුලත මූලික වටයේ විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලයට යොමු කරනු ලැබේ.

II. විනිශ්චය මණ්ඩලය විසින් දින 30 ක් ඇතුලත සූදුසු නිර්ණායක යටතේ, ගුණාත්මක බාවයෙන් යුක්ත අත් පිටපත් දෙවන වටය සඳහා තෝරා දීමට කටයුතු කරනු ලැබේ.

III. එක් එක් නාට්‍ය තරඟ අංශ සඳහා තෝරා ගත් නාට්‍ය පිටපත් සංඛ්‍යාව සංඛ්‍යාත්මකව ඉහළ අංගයක් ගනු ලබන අවස්ථාවල එම නාට්‍ය අංශයට හෝ අංශවලට දෙවන වටයක් පැවැත්වීම පිළිබඳ තීරණ ගැනීමේ බලය නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ සතු වේ.

IV. එසේ දෙවන වටයක් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් නාට්‍ය පිටපත් ප්‍රමාණයක් නොමැති නම්, දෙවන වටයක් නොපවත්වා අවසන් වටය පැවැත්වීම පිළිබඳ තීරණ ගැනීමේ බලය නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ සතු වේ.

V. විනිශ්චය මණ්ඩලය විසින් ඉදිරි වට සඳහා නිර්දේශ කර නාට්‍ය පිටපත් පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට ලද දින සිට දින 14 ක් ඇතුළත එම නාට්‍ය පිටපත් යොමු කර අයදුම්කරුවන්ට දෙවන වටයට සූදානම් වන ලෙස දන්වනු ලැබේ.

දෙවන වටය

I. දෙවැනි වටය සඳහා තෝරාගෙන ඇති බව දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුව දැනුවත් කළ දින සිට දින 30 ට පසු දිනක දෙවැනි වටය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

II. දෙවැනි වටයට තෝරාගත් නාට්‍යවල අධ්‍යක්ෂකවරු සමග පළාත් සංස්කෘතික නියෝජ්‍ය අධ්‍යක්ෂ රැස්වීමක් පවත්වනු ලබන අතර, එහිදී ඉදිරි වට පැවැත්වීමේ ස්ථාන, දින හා වේලාවන් පිළිබඳව එකඟතාවන් ඇතිකර ගනු ලැබේ.

III. දෙවන වටය සඳහා තෝරා ගනු ලබන නාට්‍ය කුරුණෑගල, කුලියාපිටිය, මහව, හලාවත, පූත්තලම වශයෙන් කලාප මට්ටමින් පැවැත්වීමට කටයුතු කරනු ලබන අතර, යම් කලාපයක වේදිකාගත කිරීමට තරම් ප්‍රමාණවත් නාට්‍ය නොමැති නම් පමණක් එම නාට්‍ය ආසන්න කලාපයක් වෙත යොමු කිරීමේ බලය නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ සතු වේ.

IV. මෙම වටයට ඉදිරිපත් කරන ලද නාට්‍ය අතරින් කවරක් අවසාන වටයට තෝරා ගැනීමට තරම් සූදුසු මට්ටමක තිබේදැයි පමණක් විනිශ්චය මණ්ඩලය විසින් මෙහිදී පරීක්ෂා කරනු ලබන අතර අවසාන වටයේදී මෙන් සියලු අනුශාංගික අංග පිළිබඳව පූළුල්ව සළකා බැලීමක් සිදු කරනු නොලැබේ.

V. දෙවැනි වටයේ දී පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් ශාලා පහසුකම් පමණක් ලබා දෙන අතර, රංගාලෝක හා ශ්‍රව්‍ය - දෘශ්‍ය උපකරණ ලබා දීමට කටයුතු කරනු නොලැබේ.

VI. මෙම වටයටයේ දී අවසානවටයට නොතේරුනු නාට්‍යයක් වුවද යම් සුවිශේෂී දක්ෂතාවක් සහිත නිර්මාණකරුවෙක්ව විනිශ්චය මණ්ඩලය විසින් හඳුනාගනු ලැබුවහොත් එම නිර්මාණකරුට කුසලතා මට්ටමේ ඇගයීමක් ලබා දීම සඳහා නම් කිරීමට විනිශ්චය මණ්ඩලයට හැකිය.

අවසාන වටය

I. මූලික වටය පවත්වා දින 40 ට පසුව අවසාන වටය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

II. දෙවන වටයක් නොපවත්වා අවසන් වටය පමණක් පැවත්වේ නම්, එම වටයට තෝරාගත් නාට්‍යවල අධ්‍යක්ෂකවරු සමග පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ රැස්වීමක් පවත්වනු ලබන අතර, එහිදී ඉදිරි වට පැවැත්වීමේ ස්ථාන, දින හා වේලාවන් පිළිබඳව එකඟතාවන් ඇතිකර ගනු ලැබේ.

III. මෙම වටයට තෝරාගනු ලැබූ නාට්‍යවල ශිල්පීන්ගේ පදිංචිය තහවුරු කිරීමේ සහතික සමග අදාළ නාම ලේඛනය ඔවුන්ගේ අත්සන් හා නාට්‍යට අදාළ චරිතය හෝ ශිල්පිය දායකත්වයේ තොරතුරු සහිතව නාට්‍යය රංගගත කිරීමේ දිනයට පෙර නාට්‍යයේ අධ්‍යක්ෂ විසින් පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ වෙත ලබාදිය යුතුය.

IV. අවසාන වටය සඳහා තෝරාගනු ලැබූ නාට්‍ය පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන දිනයක , වේලාවක හා ස්ථානයක රඟ දැක්වීමට නාට්‍ය අධ්‍යක්ෂක විසින් කටයුතු කළ යුතුය.

V. නාට්‍ය ඇගයීමේදී සජීවී සංගීතය පමණක් සම්මාන ලබා දීමේදී සැළකිල්ලට ලක්කරනු ලැබේ.

VI. නාට්‍යය රංගගත කිරීමට නියමිත වේලාවට විනාඩි 30 ට පෙර ඒ සඳහා සූදානම්ව සිටීමට නාට්‍ය අධ්‍යක්ෂකවරයා විසින් කටයුතු කළ යුතුය.

VII. මෙම වටයේදී වේදිකා නාට්‍යකට අදාල අධ්‍යක්ෂණය, රචනය, රූපණය, වේදිකා පරිපාලනය, නිෂ්පාදනය සහ අනුශාංගික අංග ආදිය කෘතියේ අර්ථකථනයට අදාළව ප්‍රඥස්ථ මට්ටමෙන් පවතීද යන්න සළකා බලමින් විනිශ්චය මණ්ඩලය විසින් සුදුසු නිර්ණායක මත විනිශ්චය කටයුතු කරනු ලැබේ.

VIII. විනිශ්චය මණ්ඩලය විසින් එසේ ප්‍රඥස්ත මට්ටමෙන් යුක්ත නාට්‍ය සහ නිර්මාණකරුවන් උදෙසා සම්මාන, කුසලතා හා මුදල් ත්‍යාග පිරිනැමීම සඳහා මෙම වටයෙදී තෝරාගනු ලැබේ.

IX. මෙම වටයේදී රංග ශාලා පහසුකම් ලබා දීමට අමතරව නාට්‍ය ආලෝකකරණ පහසුකම් දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබන අතර තම නාට්‍යයට විශේෂ ආලෝක පහන් හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ අවශ්‍ය වන්නේනම් නාට්‍ය නිෂ්පාදක / අධ්‍යක්ෂ විසින් ඒවා සපයා ගත යුතුය.

පැවැත්වෙන තරඟ අංශ

A.දිගු නාට්‍යය
B.කෙටි නාට්‍යය
C.ළමා නාට්‍යය (විවෘත)
D.ළමා නාට්‍ය (සීමිත)

දිගු නාට්‍යය

- ස්වතන්ත්‍ර / අනුවර්තන / පරිවර්තන වශයෙන් මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැක.
- නාට්‍යයේ ප්‍රදර්ශන කාලය විනාඩි 60 -90 අතර විය යුතුය.
- නාට්‍ය ශෛලිය හා රංග රීති පිළිබඳව නොසළකා ඉහත දැක්වූ නාට්‍ය මෙම නාට්‍ය තරගාවලිය සඳහා ඉදිරිපත් කළ හැකි අතර, පර්යේෂණාත්මක හෝ විකල්ප විදි ක්‍රමෝපායන් භාවිතා කිරීමට කිසිදු බාධාවක් නැත.මෙහිදී ගීත නාටක හෝ මූද්‍රා නාටක ඉදිරිපත් කළ නොහැක.

කෙටි නාට්‍යය

- මෙහිදී රචකයාගේ ස්වීය නිර්මාණයක් ඉදිරිපත් කිරීමට හෝ දේශීය හෝ විදේශීය සාහිත්‍ය කෘතියක් මූලාශ්‍ර කරගනිමින් කරන ලද නිර්මාණයක්ද ඉදිරිපත් කළ හැක. (අදාළ මූලාශ්‍ර තොරතුරු අයඳුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය)
- නාට්‍යයේ ප්‍රදර්ශන කාලය විනාඩි 15 – 30 ත් අතර විය යුතුය.

ළමා පරපුරේ විනෝදාස්වාදය, රසවින්දනය අරමුණු කරගෙන ළමා මානසිකත්වයට ගැලපෙන තේමාවක් යටතේ නාට්‍ය මේ යටතට ගැනේ.

- **ළමා නාට්‍ය (විවෘත)**
  - නාට්‍ය අධ්‍යක්ෂණය, රචනය, රූපනය සහ අනුෂාංගික අංග සඳහා වයස් සීමාව සළකා බලනු නොලැබේ. එසේ වුවත්, සහභාගි වෙන ශිල්පීන්ගේ අවම වයස අවුරුදු 06 ක් විය යුතුය.
  - ඉදිරිපත් කරන නාට්‍ය ස්වතන්ත්‍ර, පරිවර්තන හෝ අනුවර්තන යන ඕනෑම අංශයකින් ඉදිරිපත් කළ හැකිය.
  - නාට්‍යයේ ප්‍රදර්ශන කාලය විනාඩි 15 – 30 ත් අතර විය යුතුය.
  - නාට්‍යය සඳහා සහභාගි වන සමස්ථ ශිල්පීන් සංඛ්‍යාව 30 ට වඩා අඩුවිය යුතුය.

- **ළමා නාට්‍ය (සීමිත)**
  - සීමිත තරග අංශය යටතේ නාට්‍ය රචනය, අධ්‍යක්ෂණය සහ අනුෂාංගික අංග සඳහා වයස් සීමාව සළකා බලනු නොලැබේ. එසේ වුවත් නර්තනය, රංගනය, ගායනය යන රූපන කාර්යයන්හිදී ඉදිරිපත් විය හැක්කේ වයස අවුරුදු 6 ත් 20 ත් අතර ළමුන්ට පමණි.
  - ඉදිරිපත්කරන නාට්‍ය ස්වතන්ත්‍ර, පරිවර්තන හෝ අනුවර්තන යන ඕනෑම අංශයකින් ඉදිරිපත් කළ හැකිය.
  - නාට්‍යයේ ප්‍රදර්ශන කාලය විනාඩි 15 – 30 ත් අතර විය යුතුය.
  - නාට්‍යය සඳහා සහභාගිවන සමස්ත ශිල්පීන් සංඛ්‍යාව 30 ට වඩා අඩුවිය යුතුය.
  - මෙම තරග අංශය යටතේ අයදුම් කළ හැක්කේ විදිමත් අධ්‍යාපන ආයතනයක් නියෝජනය කරමින් පමණි.

වයඹ රාජ්‍ය නාට්‍ය උළෙලේ සම්මාන / ත්‍යාග කුසලතා සහතික ප්‍රදානය

දිගු නාට්‍ය

- හොඳම නිෂ්පාදනය I
- හොඳම නිෂ්පාදනය II
- හොඳම නිෂ්පාදනය III
- හොඳම අධ්‍යක්ෂණය
- හොඳම රචනය ස්වතන්ත්‍ර
- හොඳම රචනය අනුවර්තන / පරිවර්තන
- හොඳම නළුවා
- හොඳම නිළිය
- හොඳම සහය නළුවා
- හොඳම සහය නිළිය
- හොඳම සංගීතය
- හොඳම පසුතල නිර්මාණය
- හොඳම අංග රචනය
- හොඳම රංගාලෝකකරණය
- හොඳම රංග වස්ත්‍ර නිර්මාණය
- හොඳම වේදිකා කළමනාකරණය
- හොඳම රංග විනාසය

කෙටි නාට්‍ය

- හොඳම නිෂ්පාදනය I
- හොඳම නිෂ්පාදනය II
- හොඳම නිෂ්පාදනය III
- හොඳම අධ්‍යක්ෂණය
- හොඳම රචනය
- හොඳම නළුවා
- හොඳම නිළිය
- හොඳම සහය නළුවා
- හොඳම සහය නිළිය
- හොඳම සංගීතය
- හොඳම පසුතල නිර්මාණය
- හොඳම අංග රචනය
- හොඳම රංගාලෝකකරණය
- හොඳම රංග වස්ත්‍ර නිර්මාණය
- හොඳම වේදිකා කළමනාකරණය
- හොඳම රංග විනාසය

ළමා නාට්‍ය (විවෘත / සීමිත)

- ❖ හොඳම නිෂ්පාදනය I
- ❖ හොඳම නිෂ්පාදනය II
- ❖ හොඳම නිෂ්පාදනය III
- ❖ හොඳම අධ්‍යක්ෂණය
- ❖ හොඳම රචනය
- ❖ හොඳම නළුවා
- ❖ හොඳම නිළිය
- ❖ හොඳම සහය නළුවා
- ❖ හොඳම සහය නිළිය
- ❖ හොඳම සංගීතය
- ❖ හොඳම පසුතල නිර්මාණය
- ❖ හොඳම අංග රචනය
- ❖ හොඳම රංගාලෝකකරණය
- ❖ හොඳම රංග වස්ත්‍ර නිර්මාණය
- ❖ හොඳම වේදිකා කළමනාකරණය
- ❖ හොඳම රංග වින්‍යාසය

(ඉහත නිශ්චිතව දක්වා ඇති සම්මාන වලට අමතරව විනිශ්චය මණ්ඩලයේ නිර්දේශ මත කුසලතා සහතික ප්‍රදානය කෙරේ.)

මෙම වක්‍රලේඛනය වයඹ පළාත් රාජ්‍ය නාට්‍ය උළෙල - 2026 සඳහා වන අතර මෙම නාට්‍ය උළෙල පැවැත්වීම සම්බන්ධ නෛතික ලේඛනයද වේ. මෙම උළෙල සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් හා වැඩි විස්තර වයඹ පළාත් නියෝජ්‍ය සංස්කෘතික අධ්‍යක්ෂකගෙන් ලබාගත හැකිය.

මෙම වක්‍රලේඛනය අර්ථකතනය කිරීම හෝ සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ නව ව්‍යවස්ථාවක් සකස් කිරීම හෝ නාට්‍ය තරගාවලිය පැවැත්වෙන අතරතුර දී පැන නගින ගැටළු නිරාකරණය කරගැනීම හෝ සම්බන්ධයෙන් වන බලය වයඹ පළාත් සංස්කෘතික අමාත්‍යාංශ ලේකම් සතුය.

එම්. ඒ. ආර්. සුදර්ශනී,
ලේකම්,
සමුපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්,
විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු සහා තොරතුරු
තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ)

දිනය:- 2026/04/02

එම්.ඒ.ආර්. සුදර්ශනී
ලේකම්
සමුපකාර සංවර්ධන හා වෙළඳ ඉඩම්,
විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු
තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ)